## CI-05
## නිල්වලා ගඟ ආශ්‍රිත ජීවන ව්‍යවහාර හා තදනුබද්ධ ජනශ්‍රැති

*ධම්මික හේවගේ*

*පශ්චාත් උපාධි ඒකකය, රුහුණ විශ්වවිද්‍යාලය*

නිල්වලා ගඟ ආශ්‍රිත ව වාසය කළ අතීත ජනයා තම දිවි පැවැත්ම උදෙසා අවශ්‍ය ජීවිකා වෘත්ති ද නිල්වලා ගඟ ආශ්‍රයෙන් ම නිර්මාණය කොටගෙන තිබේ. උණ පහුරු කර්මාන්තය, මිරිදිය ධීවර කර්මාන්තය, වැලිගොඩදැමීම, ඔරු පාරු මගින් ප්‍රවාහන පහසුකම් සැපයුම, උළු ගඩොල් කර්මාන්තය යනා දී ජීවිකා වෘත්ති නිල්වලා ගඟ ආශ්‍රිත ව පැවතුනි. වර්තමානය වන විට මෙම ජීවනව්‍යවහාරයන් ශීඝ්‍ර ලෙස වියැකෙමින් පවතී. මෙම සාම්ප්‍රදායික ජීවනව්‍යවහාරයන් අනුසාරයෙන් ජනශ්‍රැති ගොඩනැගී තිබේ. මෙතෙක් සංග්‍ර නො වූ ජනකවි, ජනප්‍රවද, ජනකතා ලෙස ගොඩනැගී ඇති ජනශ්‍රැති එක්රැස් කර සංග්‍රහ කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. නිල්වලා ගඟේ පහළ ජලාධාරය ආශ්‍රිත ව ජනශ්‍රැති වැඩි ප්‍රමාණයක් හමුවෙයි. වැඩි ජන ගනත්වයක් සහිත මෙම ප්‍රදේශයේ ජනශ්‍රැති විවිධත්වයක් ද දැකිය හැකි ය. සාම්ප්‍රදායික ජීවනව්‍යවහාරයන්ගේ තාක්ෂණික දැනුම හඳුනා ගැනීම හා සංරකෂණය කිරීම උදෙසා ලේඛනගත කිරීම සෙසු අරමුණ වෙයි. මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා විවෘත සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කළ අතර ද්විතීයික දත්ත ලබා ගැනීම සඳහා ග්‍රන්ථ, වාර සඟරා, පුවත්පත් ආදිය භාවිත කරන ලදි. මෙම අධ්‍යයනයේ දී නිල්වලා ගඟ ආශ්‍රිත ජීවන ව්‍යවහාරයන්ගේ පවත්නා සාම්ප්‍රදායික තාක්ෂණික ඥානය සහ ජනකවි, ජනප්‍රවද, ජනකතා ආදී ජනශ්‍රැති යම් ප්‍රමාණයක් සොයා ගන්නා ලදි. සාම්ප්‍රදායික තාක්ෂණික ඥානය මෙහෙයවා කායික ශ්‍රමය මූලික ව ගොඩනැගුණු මෙම වෘත්තින්ගේ වෙහෙසකර භාවය හා සාමූහික භාවය නිසා මෙකී ජනශ්‍රැති ගොඩනැගී ඇති බව නිගමනය කළ හැකි ය.

*ප්‍රමුඛ පද*- නිල්වලා ගඟ, ජීවනව්‍යවහාර, ජනශ්‍රැති